00139

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

මුල් ළමාවිය හා ප්‍රාථමික අධ්‍යාපනය පිළිබඳ ඩිප්ලෝමා වැඩ සටහන

4 වන මට්ටම- අවසාන පරීක්ෂණය - 2010

**ESD 2236 – සමාජ මනෝ විද්‍යාව**

කාලය - පැය 03 යි.

---

දිනය - 2010 ජුනි 12 වේලාව - පෙ.ව. 09.30 ප.ව.12.30

---

පළමු කොටසේ සියළුම ප්‍රශ්නවලටත් දෙවන කොටසෙහි ඕනෑම ප්‍රශ්න 3 කටත් පිළිතුරු සපයන්න.

I - කොටස

01. (i) "සමාජ මනෝ විද්‍යාව" ඔබේ වචනයෙන් අර්ථ දක්වන්න.

(ii) සමාජ විද්‍යාත්මක සමාජ මනෝ විද්‍යාව සහ මනෝ විද්‍යාත්මක මනෝ විද්‍යාව අතර ඔබට හඳුනාගත හැකි ප්‍රධාන වෙනස්කම් දෙකක් (02) ක් දක්වන්න.

02. (i) පෙර පාසල් ළමයින්ගේ සමාජ මනෝ විද්‍යාත්මක ගැටළු හැදෑරීමට ඔබට භාවිතා කළහැකි පර්යේෂණ විධි ක්‍රම දෙකක් (2) ක් ලැයිස්තු ගත කරන්න.

(ii) ප්‍රජාව තුළ සමාජ මනෝ විද්‍යාත්මක පර්යේෂණවලට සහභාගි වීමේදී කෙනෙකු විසින් භාවිතා කලයුතු ආචාර ධර්ම දෙකක් (2) දක්වන්න.

03. (i) "සමාජ ස්වියත්වය" යනු කුමක්දැයි ඔබගේ වචනයෙන් කෙටියෙන් විස්තර කරන්න.

(ii) බාල ළමයින්ගේ "සමාජ ස්වියත්වය" සංවර්ධනයට මග පෙන්වීම සඳහා ගුරුවරුනට භාවිතා කළ හැකි ක්‍රම ශිල්ප තුනක් (3) ක් විස්තර කරන්න.

04. (i) ආකල්ප පිළිබඳ ABC ආකෘතිය රූප සටහන්ද ආධාර කරගෙන කෙටියෙන් විස්තර කරන්න.

(ii) ප්‍රාථමික පාසල් දරුවන්ගේ ආකල්ප වෙනස් කිරීම සඳහා ඔබට භාවිතා කළහැකි සිද්ධාන්ත දෙකක් (02) ක් නම් කර විස්තර කරන්න.

05. (i) 'ලිංගභාවය' (Gender) සහ 'ලිංගිකත්වය'(Sex) අතර වෙනස කෙටියෙන් සඳහන් කරන්න.

(ii) ප්‍රාථමික පාසල් ළමයින් තුළ ලිංගභාවය පිළිබඳව දැනුවත් බව වැඩිදියුණු කිරීම සඳහා උදව් දිය හැකි ක්‍රියාකාරකම් තුනක් (03) ඉදිරිපත් කරන්න.

06. (i) ඒත්තු ගැන්වීමෙහි (persuasion) ප්‍රධාන අංග හතර නම් කරන්න.

(ii) ප්‍රාථමික පාසල් දරුවන් අතර පණිවිඩයක් ඒත්තු ගැන්වීම සඳහා ඔවුන්ගේ චිත්තවේගවලට ආමන්ත්‍රණය කෙරෙන ක්‍රම ශිල්ප දෙකක් (02) කෙටියෙන් පැහැදිලි කරන්න.

07. (i) මුල් ළමාවියේ ළමයින් අතර දැකගත හැකි ප්‍රාථමික සමාජ සබඳතා දෙකක් (02) ක් සහ ද්විතික සමාජ සබඳතා දෙකක් (02) ලැයිස්තු ගත කරන්න.

(ii) සමකණ්ඩායම් සම්බන්ධතා මඟින් ළමයින්ට ලද හැකි වාසි දෙකක් (02) ලැයිස්තු ගත කරන්න.

08. (i) 'ආක්‍රමණශීලිත්වය' යනු කුමක්දැයි ඔබේ වචනයෙන් කෙටියෙන් විස්තර කරන්න.

(ii) ළමයින්ගේ ආක්‍රමණශීලී චර්යා පාලනය කළ හැකි ක්‍රම ශිල්ප හතරක් (04) ක් දක්වන්න.

(ලකුණු 5 x 8 = 40)

## II - කොටස

09. (i) සමාජ මනෝ විද්‍යාවේ විෂය පථය කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 10)

(ii) ප්‍රාථමික පාසල් පළමු ප්‍රධාන අවධියෙහි ළමයින් තුළ දැකිය හැකි සමාජ මනෝවිද්‍යාත්මක ප්‍රශ්න පිළිබඳව බුද්ධි කලම්බනයක් කිරීම සඳහා මානසික සිතියමක් අඳින්න. අවම වශයෙන් ගැටළු පහක් (05) වත් ඇතුළත් කරන්න. (ලකුණු 10)

10. (i) සමාජ ස්වියත්වය පිළිබඳ (දෘෂ්ටීන්) අදහස් ඉදිරිපත් කළ සමාජ මනෝ විද්‍යාඥයන් දෙදෙනෙක් (02) නම් කරන්න.

(ලකුණු 02යි.)

(ii) සුදුසු උදාහරණ දක්වමින් ඉහත දෘෂ්ටීන්ගෙන් එකක් කෙටියෙන් පැහැදිලි කරන්න.

(ලකුණු 08යි.)

(iii) ළමයින්ගේ 'සමාජ ස්වියත්ව සංවර්ධනය' සඳහා 'භූමිකා රංගනය' සහ 'භූමිකා ගැනීම' උපකාර වන්නේ කෙසේදැයි විස්තර කරන්න.

(ලකුණු 10යි.)

11. (i) Robert Baron ගේ දෘෂ්ඨිය මත පදනම් වෙමින් ඔබ ළමයින් තුළ ආක්‍රමණශීලි චර්යාවක් හඳුනාගන්නේ කෙසේද ? පැහැදිලි කරන්න.
(ලකුණු 07යි.)

(ii) ඉහත ආක්‍රමණශීලි චර්යාව විස්තර කිරීමට ඔබට උදව් කරන සිද්ධාන්ත (3)තුනක් අවම වශයෙන් සඳහන් කරන්න.
(ලකුණු 03යි.)

(iii) සමාජයීය වශයෙන් සම්මත ආකාරයට ළමයින්ගේ චිත්තවේග පාලනය කිරීමට ගුරුවරයෙකුට භාවිතා කළහැකි ක්‍රම ශිල්ප 3 ක් පැහැදිලි කරන්න.

12. (i) බාල ළමයින්ගේ ඉගෙනුම සහ සංවර්ධනය පිළිබඳ දෙමව්පියන් තුළ පෙන්නුම් කෙරෙන පොදු සෘණ ආකල්ප 05 බැගින් ලැයිස්තු ගත කරන්න.
(ලකුණු 05යි.)

(ii) ඉහත දැක්වුණු සෘණ ආකල්ප වෙනස් කිරීමට යාමේදී ගුරුවරියක වශයෙන් ඔබට මුහුණදීමට සිදුවිය හැකි ගැටළු තුනක් (03) විස්තර කරන්න.
(ලකුණු 07යි.)

(iii) ආකල්ප වෙනස් කිරීමට පිළිබඳ ඔබ උගත් සිද්ධාන්තවලින් එකකට අනුව ඉහත ආකල්ප වෙනස් කිරීම සඳහා ඔබට ගත හැකි පියවර විස්තර කරන්න.
(ලකුණු 08යි.)

13. (i) සමකණ්ඩායමක සිටින විවිධ වර්ගයේ දරුවන්ගේ ලක්ෂණ විශ්ලේෂණය කරන්න.
(ලකුණු 10යි.)

(ii) සුදුසු පරිදි උදාහරණ දක්වමින් මුල් ළමාවියේ දරුවන් ක්‍රමානුකූලව මිත්‍රත්ව ගොඩනඟා ගන්නා අයුරු පැහැදිලි කරන්න.
(ලකුණු 10යි.)

14. පහත සඳහන් ඕනෑම මාතෘකා දෙකක් (02) පිළිබඳව කෙටි සටහන් ලියන්න.

i. පෙර පාසල් ගුරුවරුනට ඒත්තු ගැන්වීමේ ක්‍රම ශිල්ප ඉගෙනුමෙහි වැදගත්කම

ii. ප්‍රාථමික පාසල් දරුවන්ගේ සමාජ සබඳතා කෙරෙහි විචයනය හා අගතියෙහි බලපෑම

iii. "ඉච්ඡාභංගත්වය සැමවිටම ළමයින්ව ආක්‍රමණශීලිත්වය කරා යොමු කරවයි."උදාහරණ තුනක් සමග මෙම ප්‍රකාශයට සහය දක්වන්න.

iv. මුල් ළමා වියේදී ලිංගික භූමිකාව පිළිබඳ ඉගැන්වීමෙහි වැදගත්කම.'

(ලකුණු 10 x 2 = 20)
(මුළු ලකුණු 20 x 3 = 60

- හිමිකම් ඇවිරිණි. -

**THE OPEN UNIVERSITY OF SRI LANKA**

**DIPLOMA IN EARLY CHILDHOOD & PRIMARY EDUCATION –**

**FINAL EXAMINATION – 2010 - LEVEL 4**

**ESD 2236 – SOCIAL PSYCHOLOGY**

**DURATION : THREE (03) HOURS**

**DATE: 12th June 2010** **TIME : 09.30 a.m.-12.30 p.m.**

**Answer all the questions from Part I and answer any three questions from Part II.**

## PART - I

01. i. Define "social psychology" in your own words.
    ii. State two main differences between sociological-social psychology and psychological social psychology.

02. i. List out two research methods you would apply to study social-psychological problems of pre-school children.
    ii. State two ethical considerations one should apply when conducting social psychological research in the community.

03. i. What is "social self"? Briefly describe in your own words.
    ii. Explain three procedures that should be implemented by teachers to facilitate the development of social self in young children.

04. i. Briefly describe the 'ABC model' of attitudes with an illustration.
    ii. Name and explain two theories that you would apply to change attitudes of primary school children.

05. i. Briefly state the difference between 'gender' and 'sex'
    ii. Present three activities which would support to improve gender awareness among primary children.

06. i. Name the four main components of 'persuasion'
    ii. Briefly explain two strategies appeal to emotions that you would to persue a massage among primary school children.

07. i. List out two primary relationships and two secondary relationships you could observe among children in early childhood.

ii. Briefly explain two advantages of having Peer relationships among children.

08. i. What is 'aggression'? Briefly describe in your own words.

ii. State 5 strategies you can adopt to minimize aggression in children.

Marks 5 x 8 = 40 marks

## PART - II

09. i. Describe the scope of social psychology in brief.

(10 marks)

ii. Draw a mental model (mind map) to brain storm about the socio-psychological problems you would experience in primary school children in the key stage one.

(10 marks)

10. i. Name two social psychologists who presented the views about social self.

(02 marks)

ii. Briefly explain one of the above views citing relevant examples.

(08marks)

iii. Explain how would 'role playing' and 'role taking' help the development of "social Self" in children.

(10 marks)

11. i. How would you identify an aggressive behaviour in children based on the views of Robert Baron?

(10 marks)

ii. Name three theories which would support you to explain aggressive behaviour in children.

(03 marks)

iii. Explain three strategies a teacher could use to control emotions of young children in socially accepted manner.

(07 marks)

12. i. List 5 common negative attitudes each visible in parents about learning and development in young children.

(05 marks)

ii. Describe three (03) problems you would encounter as teachers in the process of changing such negative attitudes in parents.

(07 marks)

iii. On the basis of any theory you have learnt, explain the process that you would follow to change such attitudes in parents

(08 marks)

13. i. Analyse the characteristics of different types of children in a peer group.
(10 marks)

ii. Explain how children gradually build up friendships in early childhood period citing appropriate examples.
(10 marks)

14. Write short notes on any two (02) of the following topics.

i. Importance of learning persuasion strategies for pre school teachers.
ii. The impact of prejudice and discriminations on social relationships of primary school children.
iii. "Frustration always leads to aggression". Support of this idea with three examples.
iv. Importance of teaching gender roles in early childhood years.

10 x 2 = 20
Full marks 20 x 3 = 60

*- Copyrights reserved -*